# ආයුර්වේදයෙහි විවරිත උන්මාද රෝග සහ මනෝචිකිත්සක ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

ගොමිල ගුණාලංකාර හිමි

## හැඳින්වීම

මානසික රෝග හඳුනාගැනීමේ හා ප්‍රතිකාර ක්‍රමශිල්ප භාවිත කිරීමෙහිලා මිනිසාගේ කුතුහලය අවුරුදු දහස් ගණනක් අතීතයට දිවයයි. දැනට අනාවරණය කරගෙන පවතින ඓතිහාසික වාර්තාවන් අනුව පෙලියෝලිතික, මොසැලිතික, නියොලිතික ආදි යුගයන්හි සිට ම මිනිසුන් විශ්වාස කළේ විවිධ අදෘශ්‍යමාන බලවේගයන්හි බලපෑම මත මානසික රෝග ඇති වන බවයි. ඒ අනුව මානසික රෝග තත්වයන්ට ප්‍රතිකාර ලෙස හිස් කබල සිදුරුකොට කරන ලද කායික ප්‍රතිකාර ක්‍රම මෙන්ම ශාන්ති කර්ම, බලියාග, තොවිල් වැනි අභිචාරමය මානසික ප්‍රතිකාර ද සිදු කර ඇති බව පර්යේෂණාත්මක තොරතුරු මගින් පෙන්වා දෙයි.[1]

අවුරුදු තුන්දහසකට (3000) වඩා පැරණි අතීතයක සිට සංවර්ධනය වෙමින් පැවත එතැයි සැලකෙන ආයුර්වේද වෛද්‍යවිද්‍යාව තුළ ද මානසික රෝග පිළිබඳ පැහැදිලි තොරතුරු ඇතුළත් වේ. විශේෂයෙන් ම චරක සංහිතා, සුශ්‍රැත සංහිතා, අෂ්ටාංග හෘදය වැනි ආයුර්වේද ග්‍රන්ථයන්හි දැක්වෙන උන්මාද රෝග සහ ප්‍රතිකාර ක්‍රම යටතේ මානසික රෝග පිළිබඳ විශේෂ කරුණු රාශියක් අනාවරණය කෙරෙයි. විද්වතුන් පෙන්වා දෙන පරිදි අෂ්ටාංග ආයුර්වේදයෙහි අංගයක් වන 'භූතවිද්‍යාව' මානසික රෝග සහිත පුද්ගලයන්ට ප්‍රතිකාර ක්‍රමයක් ලෙස භාවිත වන අතර ශාන්තිකර්ම, බලිතොවිල් ආදිය ඉන් සංවර්ධනය වූ අංගයන් වේ.[2] ඒ අනුව ආයුර්වේදයෙහි එන මානසික රෝග විග්‍රහයන් සහ ඒවාට නියම කරන ලද විවිධ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව සංක්ෂිප්ත විග්‍රහයක් ඉදිරිපත් කිරීමට මෙම ලිපිය තුළින් අපේක්ෂා කෙරෙයි.

**ආයුර්වේදීය ස්වස්ථතා සංකල්පය**

ආයුර්වේදය අනුව හුදෙක් කායික රෝගයකින් තොරව ජීවත්වීම පමණක් ම පුද්ගලයෙකුගේ සෞඛ්‍යය හෙවත් ස්වස්ථතාව ලෙස අර්ථවත් නොකෙරෙයි.

''සමදෝෂඃ සමාග්නිශ්ච - සමධාතුමලක්‍රියා

ප්‍රසන්නාත්මේන්ද්‍රියමනාඃ - ස්වස්ථ ඉත්‍යභිධීයතෙ''

යන සුශ්‍රැතසංහිතා ශ්ලෝකයෙන් අර්ථවත් කෙරෙන පරිදි පුද්ගලයෙකුගේ ස්වස්ථතාව යනු ''සම ලක්ෂණයෙන් යුක්ත දෝෂ, අග්නි, ධාතු, මල ක්‍රියාවන්ගෙන් ද ප්‍රසන්න වූ ආත්ම, ඉන්ද්‍රිය, මන යන අංගයන්ගෙන් යුක්ත වන තැනැත්තා නිරෝගී පුද්ලයෙකි''[3] යනුවෙන් පැහැදිලි කෙරෙයි.

ආයුර්වේදීය මූලාශ්‍රය අනුව ද පුද්ගලයා කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද රෝගී වේ. උක්ත ශ්ලෝකයෙහි ඉන්ද්‍රිය ලෙස දැක්වෙන්නේ භෞතිකව දෘෂ්‍යමාන වන පංච ඉන්ද්‍රියයන් ඇතුළත් කොට ඇති ශරීරයයි. මන යනුවෙන් දැක්වෙන්නේ පුද්ගලයාගේ මානසික ක්‍රියාකාරිත්වයයි. හින්දු සම්ප්‍රදාය අනුව මන සහ ශරීරයට අමතරව අවිනශ්වර ආත්මයක් ද පුද්ගලයාට පවතියි. ස්වස්ථතාව යනු මෙම ත්‍රිවිධ අංගයන්හි ප්‍රශස්ත ක්‍රියාකාරිත්වයයි. ''යම් සේ දඬු තුනක් එකිනෙක සංයුක්ත කළ විට නොපෙරළී සිටීමට සමර්ථ වේද ඒ සංයුක්ත දඬු තුන මත මැටි බඳුන් ආදිය තැබුවත් දරා සිටී ද එසේම මනස්, ආත්මන්, ශරීර යන පදාර්ථයන්ගේ සංයෝගජාත පුරුෂයා ද එම දඬු තුන මෙන් සිටීමට සමර්ථ වන්නේ ය.''[4] යනුවෙන් දැක්වෙන චරක සංහිතා පාඨයෙන් එය තහවුරු කෙරෙයි.

ආයුර්වේදය අනුව වා, පිත්, සෙම් යන ත්‍රිදෝෂ කිපීමෙන් පුද්ගලයාගේ කායික ස්වථතාව පිරිහී යයි. බොහෝ විට එම තත්වයන් මානසික සෞඛ්‍යයට ද බලපාන ආකාරය විග්‍රහ කොට දක්වා තිබේ. වාත දෝෂයෙහි මානසික ලක්ෂණය බියයි. වාත දෝෂ හේතුවෙන් අධික කලබල වීමේ ස්වභාවය, අස්ථිර බව, අධිකව සිතීම, පාලනය කිරීමේ දුෂ්කර බව, අධි සංවේදී බව ආදි තත්වයන් ඇති විය හැකි ය.

පිත් කිපීම් හේතුවෙන් පුද්ගලයා තුළ කෝධය උත්සන්න වේ. මුරණ්ඩු භාවය, අධික තණ්හාව, කෝපය ආදිය එහිදී දැකිය හැකි ලක්ෂණයන් ය. සෙම් හෙවත් කළු කිපීම ලෝභය ඊර්ෂ්‍යාව වැනි මානසික ලක්ෂණ හා සම්බන්ධ ය. අධික නිද්‍රාශීලී බව, දවල් හීන දැකීම, අතීතයට ආශා කිරීම වැනි තත්වයන් එම පුද්ගලයාගෙන් නිරීක්ෂණය කළ හැකිය.[5]

චරක සංහිතාව දක්වන පරිදි මෙම වා පිත් සෙම් යන ත්‍රිදෝෂය මූලික වශයෙන් ම ශාරීරික දෝෂයන් වන අතර ඒවායෙහි බලපෑම මත පුද්ගලයාගේ මානසික ස්වභාවයන් ද අසාමාන්‍ය බවට පෙරළිය හැකි ය. පුද්ගලයා තුළ පවතින රජස් සහ තමස් යනු ත්‍රිදෝෂයන්ට සාපේක්ෂව ඇති වන මානස දෝෂයන් ය.[6] ඒවා මානසික රෝග තත්වයන්ට සමාන ලෙස සැලකීම ද අනුචිත නොවේ. මේ අතුරින් රජස් ගුණය යනු දුක ඉපිදවීමට හේතු වන මනස කිළිටි කරන මානසික තත්වයකි. ඊට ආවේණික ලක්ෂණ ලෙස,

- අධික කාමුක බව හෙවත් දැඩි ආශා සහිත බව
- කිපෙන සුළු බව
- ලෝභය
- උඩඟු බව
- මානය හෙවත් අනුන් සමග තමා සැසඳීම
- අධි ක්‍රියාශීලී බව හා අවිවේක බව
- දැඩි, රළු සිත් ඇති බව

ආදිය දැක්වේ. තමස් ගුණය පුද්ගලයෙකුගේ නුවණ මද බව, මූඪ, අඥාන බව අර්ථවත් කරයි. තමස් යන්නෙහි අර්ථය අඳුර යන්නයි. මෙම තත්වයෙහි ලක්ෂණ ලෙස,

- ධාරණ ශක්තිය හීන වීම
- අලස, උදාසීන බව
- නින්දට වැඩි කැමැත්තක් දැක්වීම

- බුද්ධි හීන බව
- නිතර කණස්සලු ස්වභාවයෙන් පසුවීම
- අසත් චර්යා සහිත වීම

ආදිය නිරීක්ෂණය කළ හැකි ය.[7] මානසික කායික රෝගවලට පදනම් වන මෙම රජස් හා තමස් ගුණයන් සෑම පුද්ගලයෙකු තුළ ම අඩු වැඩි වශයෙන් පැවතිය හැකි අතර සත්ව ගුණය ලෙස නම් කෙරෙන යහපත් මානසික ගුණාංග දියුණු කර ගැනීමෙන් පුද්ගලයා තුළ මානසික ස්වස්ථතාව ඉහළ නංවා ගත හැකි ය. චරක සංහිතාවෙහි දැක්වෙන පරිදි ඥාන, විඥාන, ධෛර්යය, ස්මෘති සහ සමාධි යන ගුණාංග වර්ධනය කිරීමෙන් රජස් සහ තමස් මූලික මානසික දෝෂ ඉක්මවිය හැකි වේ.[8] එසේම වා පිත් සෙම් යන ත්‍රිදෝෂයන්ට අමතරව නැකැත් තාරකා ග්‍රහදෝෂ, භූත ප්‍රේත භය, තිරිසන් සතුන් හා ගෘහ දෝෂ ආදිය ද පුද්ගලයාගේ ස්වස්ථතාව පිරිහීමට හේතුවන බව චරක සංහිතාව පෙන්වා දෙයි.[9]

## උන්මාද රෝග

චරක සංහිතාව, සුශ්‍රැත සංහිතාව ආදි ඉපැරණි ආයුර්වේද ග්‍රන්ථයන්හි පුද්ගලයාට වැළඳෙන මානසික රෝග තත්වයන් හා ඊට අදාළ නිදාන හෙවත් හේතු, පූර්ව රූප, රූප, සාධ්‍යත්ව, අසාධ්‍යත්ව, චිකිත්සා සූත්‍ර යන අංගයන් විස්තරාත්මකව දක්වා තිබේ. මෙම විග්‍රහයන්ට අනුව මානසික රෝග තත්වයන් හැඳින්වීම සඳහා පොදුවේ භාවිත ව්‍යවහාරයක් ලෙස 'උන්මාද රෝග' යන්න හඳුනාගත හැකි ය. 'භාෂාත්මක වශයෙන් ගත් කල්හි උත් + මාද යන වචන සංයෝග යෙන් උන්මාද යන්න සකස් වේ. උත් යන්නෙන් අධිකව උද්ගත වූ, උන්මාර්ගගාමී වූ හෝ විමාර්ගගාමී යන අර්ථයන් ප්‍රකට කෙරෙයි. මාද යනු මත් ගතියයි. ඒ අනුව මනසේ ඇති වන මත් ගතිය, අධික ව්‍යාකූල ස්වභාවය, අස්වාභාවික බව, අසාමාන්‍ය බව උන්මාද යන්නෙන් අර්ථවත් කෙරේ. පුද්ගලයකුට සමාජය පිළිගත් සාම්ප්‍රදායික, නෛතික හෝ සදාචාර රාමුවට අනුව හැසිරීමේ, පැවතීමේ දුෂ්කරතාව සහිත මානසික ආබාධ තත්වයක් ලෙස උන්මාදය හැඳින්වෙයි.'[10]

උන්මාද නොහොත් උමතු බව පිළිබඳව බෞද්ධ සාහිත්‍යය තුළ ද බොහෝ ස්ථානයන්හි සඳහන් වේ. ඒ උම්මත්තක යන පාළි ව්‍යවහාරය ආශ්‍රිත විස්තරයන් ය. විශේෂයෙන් ම ආස්‍රවයන් ක්ෂය නොකළ, කෙලෙස් බරිත පෘථජ්ජන පුද්ගලයා නිරන්තරයෙන් ම පාහේ චෛතසික රෝගයන්ගෙන් පීඩාවට පත් වන බව රෝග සූත්‍රාගත විස්තරයෙන් පැහැදිලි වෙයි.[11] පපඤ්චසූදනී නම් වූ මජ්ඣිමනිකායට්ඨකථාවෙහිදී පෘථජ්ජන ස්වරූපය පැහැදිලි කරන ''උම්මත්තකො විය හි පුථුජ්ජනො''[12] සහ සංයුත්තනිකායට්ඨකථාවෙහි සඳහන් ''උම්මත්තකො විය බාලපුථුජ්ජනො''[13] යන පාඨයන් ඉතා ප්‍රකට ය. එවැනි විග්‍රහයන් අනුව උපකල්පනය කෙරෙන්නේ පොදුවේ ගත්කල පෘථජ්ජන පුද්ගලයා උම්මත්තක නොහොත් උමතු ස්වරූපයෙන් හැසිරෙන බවකි. ජාතකට්ඨකථාවෙහි සත ජාතකයෙහි එන ''තත්ථ කෙවලං ද්වාරකං ඉමන්ති කස්මා උම්මත්තකො විය හුත්වා සකලං ඉමං ද්වාරවතීනගරං විචරන්නො 'සසො, සසො' ලපති. කො ත්වං සසං හරි, කෙන තෙ සසො ගහිතොති පුච්ඡති''[14] යනුවෙන් සත පණ්ඩිතයාගේ වැළපීම තුළින් උම්මත්තක හෙවත් මානසික රෝගියකුගේ අසාමාන්‍ය චර්යා ස්වභාවය නිරූපණය කොට තිබේ.

බෞද්ධ සාහත්‍යයෙහි මෙසේ දැක්වෙන උම්මත්තක යන්න කෙබඳු ස්වරූපයක් ද යන්න පිළිබඳ පැහැදිලි විග්‍රහයක් විනය පිටකයේ පාරාජිකාඛණ්ඩ අට්ඨකථාවෙහි ඇතුළත් වෙයි. එහි දැක්වෙන පරිදි මෙසේ ය.

''උම්මත්තකො නාම පිත්තුම්මත්තකො. දුවිධඤ්හි පිත්තං - බද්ධපිත්තං, අබද්ධපිත්තඤ්චාති. තත්ථ අබද්ධපිත්තං ලොහිතං විය සබ්බංගගතං, තම්හි කුපිතෙ සත්තානං කණ්ඩාකච්ඡුසරීරකම්පාදිනී හොන්ති. තානි භෙසජ්ජකිරියාය වූපසමන්ති. බද්ධපිත්තං පන පිත්තකොසකෙ ඨිතං. තම්හි කුපිතෙ සත්තා උම්මත්තකා හොන්ති විපල්ලත්ථසඤ්ඤා හිරොත්තප්පං ඡඩ්ඩෙත්වා අසාරුප්පාචාරං චරන්ති. ලහුකගරුකානි සික්ඛාපදානි මද්දන්තාපි න ජානන්ති. භෙසජ්ජකිරියායපි අතෙකිච්ඡා හොන්ති...''[15]

''උම්මත්තක නම් පිත්තෝන්මත්තක තෙමේ ය. බද්ධ පිත සහ අබද්ධ පිත යනුවෙන් පිත ආකාර දෙකකි. එහි අබද්ධ පිත රුධිරය

මෙන් සියලු ශරීරාංග තුළ පැතිර සිටියි. එය කිපුණු කල්හි කණ්ඩු කච්ඡු ශරීර කම්පා වීම් ආදි කායික රෝග වෙයි. එය ඖෂධයෙන් සුව කළ හැකි ය. බද්ධ පිත පිත්තකොසකයෙහි තිබෙයි. එය කිපුණු කල්හි පුද්ගලයා උම්මත්තක වෙයි. විකාර වූ, වියවුල් වූ සංජානනයන් සහිත වන අතර හිරි ඔත්තප්ප (ලැජ්ජා භය) නොමැතිව අසාරුප්පචාර හෙවත් නොගැළපෙන ලෙස හැසිරෙයි. ලොකු කුඩා සීල ශික්ෂාවන් ගැන මදක්වත් නොදනියි. බෙහෙතින් ද සුවකිරීම දුෂ්කර වෙයි.''[16]

මෙහි උම්මත්තක බව පිත කිපීමෙන් ඇති වන උම්මත්තක රෝගියා අර්ථවත් කොට ඇති අතර එවැනි පුද්ගලයා පැහැදිලිව ම අසාමාන්‍ය චර්යාවන් දක්වන්නෙක් ලෙස විග්‍රහ කෙරෙයි. එම පුද්ගලයාගේ සංජානනයන් සම්පූර්ණයෙන් ම විකෘති වෙයි. ලැජ්ජා භය පිරිහී යන අතර සාමාන්‍ය සමාජ සදාචාරය පවා නොදන්නා තත්වයට පත්ව අසාමාන්‍ය ලෙස හැසිරෙයි. එය බෙහෙතකින් ද සුව කළ නොහැකි බව එහි දැක්වෙයි. එහි තවදුරටත් දැක්වෙන පරිදි බිත්තචිත්ත නම් හළසිත් ඇත්තේ යක්ෂෝන්මත්තක රෝගියා වේ.[17]

කුපිතෙ සත්තා උම්මත්තකා හොන්ති, විපල්ලත්ථචිත්තා හිරොත්තප්පං ඡඩ්ඩෙත්වා අකත්තබ්බං කරොන්ති, අභාසිතබ්බං භාසන්ති, අචින්තිතබ්බං චින්තෙන්ති.

මෙවැනි උම්මත්තක ස්වභාවයන් පිළිබඳව ත්‍රිපිටකයේ බොහෝ තැන්හි විස්තර දැක්වේ. ඛුද්දකනිකායට අයත් ඛුද්දකපාඨ අට්ඨකථාවේ දැක්වෙන පරිදි උම්මත්තක බවට පත් පුද්ගලයා විපරීත සිත් ඇත්තේ විකෘති චින්තන ඇත්තෙකු වේ. හිරිඔතප් හළ හේ නොකළ යුතු දේ කරයි, නොකිය යුතු දේ කියයි, නොසිතිය යුතු දේ සිතයි.[18] මෙම විග්‍රහයන්ට අනුව උම්මත්තක බව යනු පැහැදිලිව ම මානසික රෝග තත්වයන් හැඳින්වීම සඳහා යොදන ලද භාවිතයක් බව සඳහන් කළ හැකි ය. එය වඩාත් තහවුරු කෙරෙන උන්මාද හෙවත් මානසික රෝග අටකින් (08) යුතු වර්ගීකරණයක් ජාතකට්ඨකථාවෙහි දරීමුඛ ජාතකයෙහි දැක්වේ. එනම්,

- කාම උම්මත්තක
- ක්‍රෝධ උම්මත්තක

- දිට්ඨි උම්මත්තක (දර්ශන)
- මෝහ උම්මත්තක
- යක්ෂ උම්මත්තක
- පිත්ත උම්මත්තක
- සුරා උම්මත්තක
- ව්‍යසන උම්මත්තක[19]

යනුවෙන් දැක්වෙන තත්වයන් ය. ආයුර්වේදයෙහි දැක්වෙන වා පිත් සෙම් ආදී ත්‍රිදෝෂ මූලික කරගෙන සහ දේව, යක්ෂාදීන්ගේ බලපෑමෙන් ඇති විය හැකි උන්මාද වර්ගීකරණයන් ද මීට සමානව සැලකිය හැකි ය. එසේම චර්යාත්මක, සමාජමය, අධිභෞතික සහ පාරිසරික හේතු මූලිකව උන්මාද තත්වයන් ඇති විය හැකි බව මින් අනාවරණය කෙරෙයි.

ආයුර්වේද ශාස්ත්‍රයෙහි මානසික රෝග සහ චිකිත්සාවන් පිළිබඳ පැහැදිලි විවරණයක් ඉදිරිපත් කරයි. විශේෂයෙන් ම චරක සංහිතාවෙහි එන උන්මාද නිදානයෙහි පැහැදිලි කෙරෙන පරිදි මනස, බුද්ධිය, සංඥාව, ස්මෘතිය, ශක්තිය, ශීලය, චේෂ්ටාව, ආචාරය යන අංගයන්ගේ අයථාභාවය, දුෂ්කෘතිය, මනා ලෙස ක්‍රියාත්මක නොවීම, විභ්‍රමය උන්මාදයයි.[20] මානසික විභ්‍රමය නම් සවිඥානික, චිත්තවේගික ක්‍රියාකාරිත්වයට බාධා පැමිණවීමයි. බුද්ධි, සංඥා හා ස්මෘති විභ්‍රමයෙන් දැක්වෙන්නේ ප්‍රජානන ක්‍රියාකාරිත්වයෙහි අසාමාන්‍ය බවයි. ශීල, චේෂ්ටා සහ ආචාර විභ්‍රමයෙන් පැහැදිලි කෙරෙන්නේ උන්මාදයට පත් පුද්ගලයාගේ චර්යාවෙහි අසාමාන්‍ය බවයි. ඒ අනුව උන්මාද රෝගයට පත් පුද්ගලයන් තුළ ප්‍රජානනමය, චර්යාත්මක හා චිත්තවේගීමය වශයෙන් පැහැදිලි අසාමාන්‍ය ලක්ෂණ නිරීක්ෂණය කළ හැකි බව චරක සංහිතාව පෙන්වා දෙයි.

චරක සංහිතාවෙහි හත්වන ආධ්‍යායය වන උන්මාද නිදාන ව්‍යාඛ්‍යාවෙහිදී උන්මාද රෝග පහක් පිළිබඳව විග්‍රහ වේ. එනම්,

1. වාතජ උන්මාද

2. පිත්තජ උන්මාද

3. කඵජ උන්මාද

4. ත්‍රිදෝෂජ උන්මාද

5. ආගන්තුජ (අගන්තුක) උන්මාද[21]

යනුවෙනි. මෙහි දැක්වෙන වාතාදී දොස් කිපීමෙන් හටගන්නා උන්මාද රෝග හතර ඇතිවීමේ ප්‍රවණතාවය පවතින පුද්ගල ලක්ෂණ සමූහයක් ද විස්තර වේ. ඒ අනුව බියසුලු, රජස් හා තමස් ගුණයෙන් අපිරිසිදු වූ, සත්ව ගුණය හීන වූ, වාතාදි දෝශයන් බහුල, මල සහිත විකෘති ද්‍රව්‍යයන් සංස්කාරය කළ, අනුචිත ආහාරයන් පරිහරණය කළ, තන්ත්‍ර ප්‍රයෝග ආදිය අනුචිතව භාවිත කළ හෙවත් විෂම භාවයෙන් හැසිරුණා වූ, විෂම චර්යාවන් ඇති, කාම අනුරාග ක්‍රෝධ ලෝභ හර්ෂ භය මෝහ පරිශ්‍රම ශෝක චින්තා උද්වේග යන මේවායින් පෙළනා ලදුව බුද්ධිය මඩනා ලද සහ එකී භාවයන් අධිකව කිපියා වූ ද පුද්ගලයන් හට වාතාදී උන්මාද හතර ඇතිවීමේ භව්‍යතාවය අධික වන බව එහි සඳහන් වේ.[22] ඉන් ඉස්මතු කෙරෙන පරිදි මානසික, භාවාත්මක, චර්යාත්මක ගැටලු හේතුවෙන් මෙන්ම අනුචිත ආහාර රටාවන් හේතුවෙන් ද පුද්ගලයාට මෙකී උන්මාදයන් හටගැනීමේ භව්‍යතාවක් වේ.

එසේම මෙකී වාතාදී උන්මාදයන්හි පූර්ව ලක්ෂණ සමූහයක් ද වේ. හිසේ ශූන්‍ය බව හෙවත් අදහස් සිතුවිලි ආදියෙහි අපැහැදිලි හෝ ව්‍යාකූල බව, අස්ථානයෙහි හා අවිෂයෙහි සිතීම ආදිය චින්තනමය වශයෙන් දැකිය හැකි පූර්ව ලක්ෂණ වේ. කායික වශයෙන් ගත් කල්හි දෑසෙහි නොපැහැදිලි බව, කන්වල ශබ්ද පැවතීම, හුස්ම හෙළීම අධික බව, මුවෙන් ස්‍රාවයන් පිටවීම, ආහාර අරුචිය, ආහාර ජීර්ණය අපහසු බව, ක්ලාන්තය වැනි තත්වයන් පූර්ව ලක්ෂණ වේ. පූර්ව මානසික ලක්ෂණ අතර තද මුලා බව, උද්වේගය, නිතර සැලුණු සිත් ඇති බව ආදිය වේ. එසේම දකින සිහින අනුව ද මෙම උන්මාදන්හි පූර්ව ලක්ෂණ හඳුනාගත හැකි ය.

මෙම පූර්ව රෝග ලක්ෂණ විද්‍යමාන වීමෙන් අනතුරුව රෝගයෙහි ලක්ෂණ බහුලව දැකිය හැකි වේ. එම එක් එක් රෝග යෙහි කායික, මානසික, චර්යාත්මක ලක්ෂණ හා රෝග නිදාන චරක සංහිතාවෙහි දැක්වෙන පරිදි පහතින් පෙළගැස්වේ.

### 1. වාතජ උන්මාද රෝග නිදාන හා ලක්ෂණ

- නිදාන - රළු හෝ සිසිල් දෑ ආහාරයට ගැනීම෴ අල්ප කොට ආහාර ගැනීම, විරේක කිරීම, උපවාසය හෙවත් ආහාර නොගෙන සිටීම ආදිය නිසා වාතය අධිකව කිපීමෙන් සිතුවිලි දූෂණයවී බුද්ධිය හා ස්මෘතිය විනාශ කොට වාතෝන්මාදය ඇති කරයි.[23]

- කායික ලක්ෂණ - දෑස හා දෙබැම නිතර සංචලනය කිරීම, දෑස උඩට නෙරා සිටීම, නිකරුණේ දෙතොල - කොන්ද - හකු - දෑත් අග හා දෙපය අග - ශරීරාවයව ගැස්සීම, කටින් පෙණ ඒම ආදිය වේ.

- වාචසික හා චර්යාත්මක ලක්ෂණ - නොගැළපෙන වචන නිතර ප්‍රකාශ කිරීම, අනුචිත තැන්හි මද සිනාව - නැටීම - ගැයීම - වැයීම ආදිය සිදු කිරීම෴ විවිධ ශබ්ද අනුකරණය කිරීම, රථයකින් යන්නාක් මෙන් අභිරූපණ කිරීම, ආභරණ නොවන දෙය පැළඳීම, ආහාර නොවන දෙය ආහාරයට ගැනීමට ලෝභවීම, ලැබුණු දෙයට අවමන් කිරීම ආදිය වේ.

- මානසික ලක්ෂණ - ලෝභී බව, මසුරු බව, කර්කශ බව, දැඩි බව යනාදියයි.

### 2. පිත්තජ උන්මාද රෝග නිදාන හා ලක්ෂණ

- නිදාන - ඇඹුල්, උෂ්ණ හා අජීර්ණ දෑ ආහාරයට ගැනීම නිසා එක්රැස් වූ පිත අධිකව පුද්ගලයා පීඩාවට පත් කරමින් මානසික නිරෝගී බව නැති කොට උන්මාදය ඇති කරයි.[24]

- මානසික ලක්ෂණ - නොඉවසනසුලු බව, ක්‍රෝධය, උඩඟු බව, අස්ථානයෙහි ආඩම්බර බව.

- චර්යාත්මක ලක්ෂණ - ආයුධ, කැටකැබිලිති, කස, ලි, මිට ආදියෙන් තමාට හෝ අනුන්ට පහර දීම, පැනයාම, සෙවන, සිසිල් දිය, සිසිල් ආහාර ආදිය කැමති වීම, නිර්වස්ත්‍ර බව.

- කායික ලක්ෂණ - අවයව අතිශයින් උණුසුම් බව, දෙනෙත තඹ පැහැය හෝ හරිත වර්ණ හෝ හරිද්‍රා වර්ණයෙන් තද පැහැ වීම.

### 3. කඵජ උන්මාද රෝග නිදාන හා ලක්ෂණ

- නිදාන - ශරීරය වෙහෙසවා වැඩ නොකිරීම නිසාත් එළකිරි ආදිය අධිකව ආහාරයට ගැනීම නිසාත් සෙම් ස්වභාවය අධිකව කිපීමෙන් බුද්ධිය ස්මෘතිය නසා සිත මුළා කොට උන්මාදය ඇති කරයි.[25]

- චර්යාත්මක ලක්ෂණ - තුෂ්ණීම්භූතව, නිහඬව එක් පසෙකට වී සිටීම, සෙමින් සෙමින් ඇවිදීම, කෙළ සොටු වැගිරීම, ජනයා නොමැති තැන්වල සිටීමට ප්‍රිය වීම, නිතර නින්දට කැමති වීම.

- කායික ලක්ෂණ - ආහාර අරුචිය, සිරුරේ කැත බව, අපිරිසිදු බව, මුහුණේ ඉදිමුණු ස්වභාවය, දෑස සුදුවන්ව තෙත සහිතව කබවලින් යුක්තව සිටීම.

### 4. සන්නිපාතික උන්මාද රෝග නිදාන හා ලක්ෂණ

- වා පිත් සෙම් ත්‍රිදෝෂයන් සන්නිපාතයෙන් ඇති වන උන්මාද රෝග තත්වයයි. උක්ත දක්වන ලද වාතාදී උන්මාද ලක්ෂණ සම්මිශ්‍රව දැකිය හැකි වේ. මෙම සන්නිපාතික උන්මාදය අසාධ්‍ය හෙවත් ප්‍රතිකාරයට දුෂ්කර වූවක් ද වන බව ආයුර්වේදීය අදහසයි.[26]

### 5. ආගන්තුක උන්මාදය නිදාන හා රෝග ලක්ෂණ

ඉහතින් දක්වන ලද උන්මාද රෝග නිදාන හෙවත් ඇතිවීමට බලපාන හේතු, පූර්ව රූප හෙවත් පෙර ලක්ෂණ, රූප හෙවත් කායික

මානසික චාර්යාත්මක රෝග ලක්ෂණ ආදියෙන් වෙනස් වන යම් උන්මාද තත්වයක් වේ නම් එය ආගන්තුජ උන්මාදය ලෙස චරක සංහිතාව හඳුන්වා දෙයි. එය වාතාදි තුන්දොස් බලපෑමෙන් සිදුවන්නක් නොවන අතර පෙර කරන ලද අකුසල කර්ම ඇතුළත් ප්‍රඥාපරාධ හේතුවෙන් ඇති වේ.[27] මහාචාර්ය ගල්මංගොඩ මහතා පෙන්වා දෙන පරිදි ප්‍රඥාපරාධ යනු මේ භවයේදී හෝ පෙර භවවලදී පුද්ගලයා විසින් මනස මූලිකව, කාමය, ක්‍රෝධය, ලෝභය, මෝහය, මද, මාත්සර්යය ආදි මානසික තත්වයන් පදනම්ව සිදු කරන ලද අකුසල ක්‍රියාවන් ය.[28] මෙම මානසික තත්වයන් උත්සන්න වූ කල්හි පුද්ගලයා සමාජ විරෝධී, ආගම් විරෝධී විවිධ චර්යාවන් දක්වයි. මව්පියාදීන්ට, පූජ්‍ය උතුමන් ආදීන්ට අවමන් කරයි. දිව්‍ය බ්‍රහ්මාදීන්ට අවඥා කරමින් ඔවුන්ට අහිතකර වූ චර්යාවන් දක්වයි. මෙසේ තමා විසින් කරනු ලබන ප්‍රඥාපරාධ හේතුවෙන් තමා ම පීඩාවට පත් වීම ආගන්තුක උන්මාද රෝගියාගේ ලක්ෂණ වේ.

මෙම ආගන්තුක උන්මාදය ඇතිවීමට බලපාන හේතු අතර පූර්ව අකුසල කර්ම මෙන්ම විවිධ අධිභෞතික බලපෑම් ද වන බව චරක සංහිතාවෙහි දැක්වෙයි. එහි දැක්වෙන පරිදි ප්‍රඥාපරාධ හේතුවෙන් අපිරිසිඳු පුද්ගලයා වෙත ඇති වන දේවග්‍රහ බැල්ම ආදි බලපෑමෙන්, ගුරු වෘද්ධ සිද්ධ මහර්ෂී ආදීන්ගේ ශාපයෙන්, පිතෘ ග්‍රහයන්ගේ තාඩන පීඩනයෙන්, ගාන්ධර්වයන්ගේ ස්පර්ශනයෙන්, යක්ෂ ග්‍රහ ආවේශයෙන්, රාක්ෂස ග්‍රහ ගන්ධ ආඝ්‍රාණයෙන්, පිශාච ග්‍රහයන් ආරූඪව වහනය කරවීමෙන් යන අධිභෞතික බලපෑම් නිදානයෙන් ද ආගන්තුක උන්මාද රෝගය ඉපදිය හැකි ය.[29]

ආගන්තුකෝන්මාදය හටගැනීමට මූලික හේතු ලෙස ආයුර්වේදයෙහි ඉස්මතු කෙරෙන දේවතා, ඍෂි, ගාන්ධර්ව, පිශාච, යක්ෂ, රාක්ෂස, පිතෘලෝක යන මොවුන්ගේ බලපෑම අනුව ආගන්තුකෝන්මාද රෝගීහු විවිධාකාර ලක්ෂණ පෙන්වති.

### භූතෝන්මාද සහ දේවෝන්මාද

ඇතැම් පුද්ගලයන්ට භූතයන් ආවේශ වීම හේතුවෙන් උන්මාද හටගනියි. එය භූතෝන්මාද නම්. එවැනි රෝග තත්වයකදී එම රෝගියාගේ කතාබහ, වික්‍රම, වීර්යය, ශාරීරික ක්‍රියාවන් ආදිය ද දේව,

භූතාදීන්ට සමානව බල සම්පන්න වේ. රෝගියා එම ශක්තීන්ගෙන් හා දැනීම්වලින් සාමාන්‍ය මනුෂ්‍යයා ඉක්මවා සිටියි.[30] වර්තමාන සමාජය තුළ ද එවැනි දේව භූතාදීන් ආරූඪ වූ රෝගීන් කොතෙකුත් අසන්න දකින්නට ලැබේ. එවැනි රෝගීන් භූතෝන්මාද රෝගීන් ලෙස චරක සංහිතාව පෙන්වා දේ. එසේ දේවාදීන් ආරූඪ වීම නිසා හටගන්නා උන්මාද යටතේ,

1. දේවග්‍රහ උන්මාද
2. පිතෘග්‍රහ (ප්‍රේත) උන්මාද
3. ගන්ධර්වග්‍රහ උන්මාද
4. යක්ෂග්‍රහ උන්මාද
5. රාක්ෂසග්‍රහ උන්මාද
6. බ්‍රහ්මරාක්ෂසෝන්මාද
7. පිශාචෝන්මාද

යනුවෙන් උන්මාද රෝග සමූහයක්[31] සහ එම රෝගීන්ගෙන් නිරීක්ෂණය කළ හැකි රෝග ලක්ෂණ වෙන වෙන ම චරකසංහිතාව තුළ විවරණය කෙරෙයි. මීට අමතරව,

8. දානව ග්‍රහ
9. උරග ග්‍රහ

යනුවෙන් භූතෝන්මාද වර්ග දෙකක් ද ගල්මංගොඩ මහතා පෙන්වා දෙයි.[32] මේවායෙහි ග්‍රහ යනුවෙන් අර්ථවත් කෙරෙන්නේ අල්ලා ගැනීම හෙවත් ග්‍රහණය කොට ගැනීමයි. එනම්, අවේශ වීම, ආරූඪ වීම නම් ස්වභාවයයි.

**අසාධ්‍ය භෞතිකෝන්මාදය**

ඉහතින් දක්වන ලද ග්‍රහ දෝෂවලින් පෙළෙන රෝගියාගේ ඉතා උග්‍රතම අවස්ථාව අසාධ්‍ය හෙවත් සුව කළ නොහැකි උන්මාද

තත්වය ලෙස සැලකේ. එවැනි රෝගියෙකු හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයක් ද දැක්වේ. අත් පා ඔසවමින් විසි කරමින්, ක්‍රෝධයෙන් කෑ ගසමින්, මුහුණ කට ආදිය විකෘති කොට පෙන්වමින් තමන්ව ම හෝ අන්‍යයෙකු හෝ මැරීමට තැත් කරමින් අසාමාන්‍ය චර්යා ලක්ෂණ පෙන්වන්නේ අසාධ්‍ය භෞතිකෝන්මාද (භූතෝන්මාද) රෝගියා ය. එම රෝගියාගේ දෑසින් කඳුළු වැගිරෙන බවත්, ලිංග යෙන් ලේ වැගිරෙන බවත්, නහසයෙන් දියර වැගිරෙන බවත්, දිවෙහි තුවාල ඇති බවත්, පිපාසයෙන් පෙළෙන බවත් දැක්වේ. එමෙන්ම ම යටි උගුරෙන් කෑගැසීම, නිතර අන්‍යයන් වැනසෙන වචනයෙන් බැණ වදිමින් කෑ ගැසීම ආදිය සිදු කරන මෙම රෝගියා පාලනය කර ගැනීමේ දුෂ්කර බව, ශරීරයෙහි දුර්ගන්ධ බව හා තමාට හෝ අනුන්ට හිංසා කිරීමට කැමති බව යන ලක්ෂණවලින් ද යුක්ත වන බව චරක සංහිතාව දක්වයි.[32] මෙම උන්මාද තත්වය සුව කළ නොහැකි ඉතා උග්‍ර තත්වයක් ලෙස සැලකෙන අතර සමාජය විසින් ද එම රෝගීයා මගහරියි. ඒ හේතුවෙන් ම බොහෝ විට ප්‍රතිකාරයක් වෙත යොමු කිරීමක් පවා සිදු නොවේ.

සමස්තයක් ලෙස මෙම උන්මාද වර්ගයන් හටගැනීම් හේතු වශයෙන් හා සාධ්‍ය අසාධ්‍ය බව අනුව ද වෙන් කොට දැක්වීමක් සිදු කෙරෙයි. එනම්, නිජ, ආගන්තුජ, සාධ්‍ය, අසාධ්‍ය වශයෙනි.

- නිජ - වා පිත් සෙම් දෝෂයන් මූලිකව ඇති වන උන්මාද රෝගයන් යී
- ආගන්තුජ - ආගන්තුක උන්මාද□ භූතෝන්මාද/ දේවෝන්මාද රෝගයන් යී
- සාධ්‍ය - අගද හෝ භූත හෝ යම් චිකිත්සා ක්‍රමයකින් සුව කළ හැකි උන්මාද රෝග□ එනම්□ වාතාදී දෝෂජ මෙන්ම ආගන්තුකජ උන්මාද ද වේ
- අසාධ්‍ය - චිකිත්සාවකින් සුව කළ නොහැකි උන්මාද රෝග□ එනම්□ අසාධ්‍ය භෞතිකෝන්මාද රෝග ආදියයී

පුද්ගලයන්ට උන්මාද රෝග ඇතිවීම සඳහා බලපාන කාල සහ පරිසර සාධක සමූහයක් ද චරක සංහිතාව පෙන්වා දෙයි. ඒ අනුව,

- පෙර කරන ලද අකුසල කර්ම විපාක දෙන කාලය
- දේව, ඍෂි, යක්ෂ, රාක්ෂසාදීන් බලපෑම් කරන කාලය
- හුදෙකලාව නිවෙස්වල වාසය කරන අවස්ථා
- සන්ධ්‍යාවෙහි හෝ ගොම්මනෙහි සිව්මංසන්ධිවල ගැවසෙන අවස්ථා
- නොහික්මුණු ඉඳුරන් ඇති ව හැසිරෙන අවස්ථා
- ස්ත්‍රී පුරුෂ සංගමය සිදුවන හෝ ඍතුමත් ස්ත්‍රීන් කරා යන අවස්ථා
- ව්‍රත බ්‍රහ්මචර්යාදි නියමයන් බිඳින අවස්ථා
- මහා යුද්ධ පවතින කාලය
- ස්වාභාවික හෝ මිනිසා විසින් ඇති කරනු ලබන දේශ නගර ගම් විනාශ වන කාලය
- ස්ත්‍රීන්ගේ ප්‍රසව සමය
- අශුභ සතුන් හෝ අපවිත්‍ර ද්‍රව්‍ය ස්පර්ශ කරන අවස්ථා
- සන්ධ්‍යාවෙහි උද්‍යාන වන සොහොන්බිම්වලට යන අවස්ථා
- බ්‍රහ්මණ දේවතා ගුරු පූජ්‍යාදීන්ට අවමන් කරන අවස්ථා

යනාදී මෙම කාල හා අවස්ථාවන් පුද්ගලයන්ට උන්මාද රෝග ඇතිවීමට භව්‍ය කාල ලෙස දැක්වේ. නූතන බටහිර මනෝවිද්‍යාව තුළ පෙන්වා දෙන මානසික රෝග ඇතිවීමට බලපාන පාරිසරික සාධක හා අවස්ථා ද මෙම කරුණුවලට බෙහෙවින් සමාන වේ. නිදසුනක් ලෙස යුද්ධ සමයකදී පශ්චාත් ව්‍යසන ක්ලමථ අක්‍රමතා

වැනි තත්වයන් බහුලව වාර්තා වෙයි. එසේම ප්‍රසව සමයේදී ස්ත්‍රීන්ට පශ්චාත් ප්‍රසව විෂාදය (වැදූගෙයි සන්නිය) වැනි මානසික අවපීඩන තත්වයන් ඇති විය හැකි ය. මෙම කාල හා අවස්ථාවන් විග්‍රහ කොට බැලීමේදී පැහැදිලි වන්නේ එවැනි මානසික රෝග ඇති විය හැකි අවස්ථා, කාල හා පාරිසරික සාධක ඉපැරණි ආයුර්වේද ග්‍රන්ථ තුළ ද ඉතා පැහැදිලිව විවරණය කොට ඇති බවයි.

මෙහි විස්තර කරන ලද චරක සංහිතාවට අමතරව සුශ්‍රැත සංහිතාව, අෂ්ටාංගහෘදය, මාධව නිධානය වැනි ආයුර්වේද ග්‍රන්ථයන්හි ද උන්මාද රෝග පිළිබඳ දීර්ඝ විස්තර ඇතුළත් වේ. මාධව නිධානයෙහි,

''ධීවිභ්‍රමඃ සත්ත්වපරිප්ලවශ්ච - පර්යාකුලා දෘෂ්ටිරධීරතාච

අබද්ධවාත්ත්වං හෘදයං ච ශූන්‍යං - සද්‍යාදාද්‍යමුන්මාද ගදස්‍ය ලිංගම්''

යන ශ්ලෝකයෙන් උන්මාදයෙහි ලක්ෂණ රාශියක් විෂද කරයි. එහි දැක්වෙන පරිදි ''බුද්ධි භ්‍රාන්තිය, සිත සැලෙන බව, නිකරුණේ ඔබමොබ බැලීම, සිතේ අස්ථිර බව, අසම්බන්ධ වචන ඇති බව හා බ්‍රහ්ම හෘදය හිස් මෙන් දැනීම ආදිය උන්මාදයෙහි සාමාන්‍ය ලක්ෂණ වේ.''[34] එසේම චරක සංහිතාවෙහි පහක් (05) ලෙස වර්ග කරන උන්මාද රෝගයන් සුශ්‍රැත සංහිතාවෙහිදී රෝග හයක් (06) ලෙස වර්ග කොට දක්වා තිබේ. ඒ මෙසේ ය.

1. වාතජ උන්මාද
2. පිත්තජ උන්මාද
3. කඵජ උන්මාද
4. ත්‍රිදෝෂජ උන්මාද
5. මනෝභිඝාතජ උන්මාද - මනසෙහි ඇති වන ශෝක ආදිය නිසා හටගන්නා උන්මාද
6. විෂජ උන්මාද - විෂ ශරීරගත වීමෙන් ඇති වන උන්මාද[35]

යනුවෙනි. මීට අමතරව අෂ්ටාංගහෘදයෙහි චිත්තසාතජ උන්මාද නමින් ධනය, වස්තුව, ජීවිත ආදි අහිමි වීම් නිසා ඇති වන මානසික පීඩාවන් හේතුවෙන් ජනිත උන්මාද රෝගයක් පිළිබඳව ද විවරණය කෙරෙයි.[36] තවද, දේශීය චිකිත්සාව තුළ උන්මාද රෝගය වර්ගීකරණ විසි දෙකක් (22) යටතේ ඉතා පුළුල්ව විග්‍රහ කෙරෙයි.[37]

## උන්මාද රෝග චිකිත්සා විධි

උන්මාද රෝග සුව කිරීම සඳහා නිර්දේශිත විවිධ චිකිත්සක ක්‍රම ආයුර්වේදය තුළ විස්තර වේ. ඒ අතර කායික වශයෙන් කරනු ලබන ඖෂධ ප්‍රතිකාර, ශල්‍ය ප්‍රතිකාර හා මානසික වශයෙන් සිදු කරන මනෝචිකිත්සාවන්, අභිචාර-අභිශාපවිධීන්ට අදාළ ශාන්තිකර්ම බලිපූජා ආදිය නිර්දේශ කර තිබේ. එසේම චර්යාත්මක හා ආධ්‍යාත්මික ප්‍රතිකාර ක්‍රම ද කායික ප්‍රතිකාර සමග සම්මිශ්‍රිතව භාවිත කරන බව හඳුනාගත හැකි ය.

විශේෂයෙන් ම ආයුර්වේදයෙහි මූල ග්‍රන්ථ අතරින් චරක සංහිතාවෙහි උන්මාද රෝග චිකිත්සාවන් පිළිබඳ කෙරෙන විග්‍රහයේදී ඉහතින් දක්වන ලද ආගන්තුක උන්මාද ඇති කරන විවිධ ග්‍රහ බලපෑම් හේතුවෙන් උපදින රතිකාම, අර්චනකාම ආදි උන්මාද සඳහා බලි, පූජා, මන්ත්‍ර, උපහාර ඇතුළත් අභිචාර-අභිශාප විධීන් සමග ඖෂධ චිකිත්සාව නිර්දේශ කොට තිබේ. කෙසේ නමුත් මෙම ලිපිය තුළ එහි නිර්දේශ කරන ඖෂධ ප්‍රතිකාර ක්‍රම නාම මාත්‍ර වශයෙන් සඳහන් කොට බලි තොවිල් ආදියෙහි මනෝචිකිත්සක ලක්ෂණ පිළිබඳ සිදු කර ඇති පර්යේෂණාත්මක තොරතුරු හා විද්වත් මත පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කෙරේ.

චරක සංහිතාවෙහි චිකිත්සා ස්ථානයෙහි නම (09) වන ආධ්‍යායය තුළ උන්මාද චිකිත්සා විධි රාශියක් විස්තර කෙරෙයි.[38] එහි දැක්වෙන පදිරි එම ප්‍රතිකාර ක්‍රම පහත පරිදිය.

වාතජ උන්මාදයේදී පළමුව ස්නේහපානය කරවිය යුතු අතර ස්නේහ, ස්වේද ප්‍රයෝග දෙකින් පසුව කඵජ උන්මාද රෝගියා සඳහා වමනය ද පිත්තජ උන්මාද රෝගියා සඳහා විරේචනය ද යෙදිය යුතු බව පෙන්වා දෙයි. එසේ කායික වශයෙන් පිරිසිදු කළ උන්මාද

රෝගියාට පත්‍ය ආහාර ලබා දීම ඊළඟ පියවර වේ. රෝගියාගේ දෝෂයට අනුරූපව නැවත නැවත එම චිකිත්සාවන් යෙදිය යුතුය. එසේ සිදු කරන චිකිත්සාවෙන් රෝගියාගේ හෘදය, ඉන්ද්‍රිය, ශිරා, කෝෂය් ආදිය මනාව පිරිසිදු වීමෙන් මනස ප්‍රසන්න වී ගිලිහී තිබූ ස්මෘති සහ සංඥාවන් නැවත උපදවා ගත හැකි වේ.

මෙසේ සිදු කිරීමෙන් ද රෝගියාගේ බිඳී ගිය සිත, ස්මෘති, සංඥාවන්, අයථා හැසිරීම් ආදිය යථා තත්වයට පත් කරගත නොහැකි වන්නේ නම් එකල්හි මනස, බුද්ධිය, සිරුර උත්තේජනය කිරීම සඳහා යෝග්‍ය තාඩනවිධිය නම් දැඩි ක්‍රම අනුගමනය කිරීම නිර්දේශ කරයි. එහිදී රෝගියා පාලනය කර ගත හැකි නම් මොළොක් ලණුවලින් බැඳ ලීදඬු යකඩකූරු ආදිය නැති අඳුරු කුටියක සිරකර තැබිය යුතු වේ. අවශ්‍ය වන්නේ නම්,

- තරවටු කිරීම
- තැතිගැන්වීම
- යමක් දීම
- සතුටු කිරීම
- අස්වැසීම
- බිය ගැන්වීම
- විශ්මයට පත් කිරීම

වැනි ක්‍රමය යෙදිය හැකි වේ. මෙම යෙදීම්වල අරමුණ වන්නේ සංඥා ස්මෘතීන් යථා තත්වයට පත් කොට රෝගියා තුළ සවිඥානික මානසික තත්වය නැවත ඇති කිරීමයි. ඒ සඳහා යෝග්‍ය ප්‍රදේහ, උත්සාදන, අභ්‍යංග, ධූපන, ඝෘතපාන ආදිය යෙදීම ද නිර්දේශ කරයි. ආගන්තුක උන්මාදයට ඝෘත පානය මෙන් ම යන්ත්‍ර මන්ත්‍රාදී විධීන් ද වඩා ඵලදායී බව පෙන්වා දේ.[39] ඖෂධ අතර සිද්ධයෝග, කල්‍යාණක ඝෘතය, මහා කල්‍යාණක ඝෘතය, මහා පෛශාචක ඝෘතය, ලශුනාදි ඝෘතය, පුරාණ ඝෘත, ප්‍රපුරාණ ඝෘත ආදිය යෙදීමට නිර්දේශ කරයි.

රෝගියා මෙම ඖෂධ සේවන නොකොට ප්‍රතික්ෂේප කරයි නම් එහිදී අංජන, උත්සාධන, ආලේපන, නස්‍ය යන විධීන් මගින් ඖෂධ ලබාදීම නිර්දේශ කෙරෙයි. මෙම ඖෂධ ප්‍රතිකාර කරමින් රෝගියා සුදුසු අවස්ථා අනුව ගෙයක හෝ ගුහාවක හෝ කුටියක හෝ සිරකර තැබීමට ද උපදෙස් දෙයි. රෝගියා රඳවාගෙන නිසි පරිදි ප්‍රතිකාර යෙදීම ඉන් අපේක්ෂා කෙරේ.

ශාරීරිකව මෙම ඖෂධ විධීන් යෙදීමට අමතරව මානසික වශයෙන් සිදු කරන උපදේශනයන් හා මනෝවිද්‍යාත්මක චිකිත්සා විධීන් ද චරක සංහිතාව තුළ නිර්දේශ කොට තිබීම සුවිශේෂී ලක්ෂණයකි. ඒ අතරින් කිහිපයක් පහත පරිදි වේ.

- දෝෂජ උන්මාද සහිත රෝගීන්ට ඖෂධ ප්‍රතිකාර දී ප්‍රණීත ආහාර පානයෙන් සංතෘප්ත කොට සුළං නොහමන ගෙයක සුව පහසු ලෙස සිටින්නට අවකාශ සලසා දීම ප්‍රතිකාර වේ.

- ඉෂ්ට වස්තු විනාශය නිසා උන්මාදයට පත් රෝගීන්ට හිතවතුන් මිත්‍රයක් පූජකයන් ආදීන් ලවා යහපත් වචනවලින් කතා කරවීම, උපදේශන ලබාදීම, අස්වසා ලීම, ඉෂ්ට වස්තු විනාශය පිළිබඳ කතා අසන්නට දීමෙන් සිදුවීම් සාමාන්‍යකරණය කිරීමේ චිකිත්සාවන් යෝග්‍ය වේ.

- වස්තු විනාශය ආදිය නිසා චිත්ත පීඩාවය පත් රෝගීන්ට ඊට සමාන වස්තු ආදිය දීමෙන් හෝ අස්වැසීමෙන් හෝ මිහිරි වචනයෙන් හෝ සිත ප්‍රකෘති තත්වයට ගැනීම යෝග්‍ය චිකිත්සාව වේ.

- චිත්ත භ්‍රාන්ති සහිත පුද්ගලයන්ට රාජ පුරුෂයන් ලවා හෝ අනතුරුදායක නොවන සර්පයන්, සිංහයන් ලවා හෝ ගිනියම් යකඩ, උණු කළ තෙල් ආදිය භාවිතයෙන් හෝ රජුන් ලවා මරවමුයි පවසමින් හෝ තැති ගැන්වීම කළ යුතු ය. ශාරීරික දුක් බයට වඩා මරණ භය මහත් නිසා එසේ කිරීමෙන් භ්‍රාන්ත වූ මනස ප්‍රකෘති තත්වයට පත්වේ යැයි ඉන් අපේක්ෂා කෙරෙයි.

එසේම පුද්ගල මනසෙහි බලපවත්වන කාමය, ක්‍රෝධය, භය, හර්ෂය හෙවත් සතුට, ඊර්ෂ්‍යාව, ලෝභය ආදි මානසික ධර්මතා නිසා හටගන්නා උන්මාද රෝග සඳහා ඊට ප්‍රතිවිරුද්ධ චිත්තවේග ජනිත වන උත්තේජ සහිත ක්‍රියාකාරකම් ලබා දීමෙන් එකී උන්මාදයන් සන්සිඳවීම සිදු කළ හැකි ය. නිදසුන් ලෙස කාමයට ප්‍රතිවිරුද්ධව කය පිළිබඳ අශුභ සංඥා ලබා දීමෙන් කාම උන්මාදය ද ලෝභයට ප්‍රතිවිරුද්ධව පරිත්‍යාගය, උදව් කිරීමේ ක්‍රියාකාරකම් මගින් ලෝභ උන්මාදය ද දුරුකළ හැකි යැයි දැක්වේ.

චරක සංහිතාව තුළ යම් යම් චර්යා සංස්කරණ චිකිත්සක විධීන් ද අනුමත කොට තිබේ. විවිධ ඖෂධ වර්ග ළඟ තබාගෙන දරා සිටීම, සත්‍යවාදීව හැසිරීම, තපස් ආදි සදාචාර ව්‍රත අනුගමනය, දන් දීම හා පරිත්‍යාගශීලී වීම, ගුරුවරුන් පූජ්‍ය පක්ෂය හා මව්පියාදීන්ට ගරු චර්යා දැක්වීම ආදිය උන්මාද රෝගීන්ට යෝග්‍ය චර්යාත්මක ප්‍රතිකාර වේ.

දේවතා, ඍෂි, පිතෘ, ගන්ධර්ව ආදි ග්‍රහ බලපෑම් නිසා උමතු වන ආගන්තුක උන්මාද රෝගීන් හට තාඩන පීඩන විධි හෝ තියුණු අඳුන් ආදිය යෙදීම නොකළ යුතු අතර ඔවුන්ට ද මනෝවිද්‍යාත්මක චිකිත්සක ක්‍රම භාවිත කිරීම උචිත බව පෙන්වා දේ. ඒ සඳහා පූජා පැවැත්වීම, බලි පූජා, උපහාර පූජා, මන්ත්‍ර සජ්ඣායන, අඤ්ජන, ශාන්තිකර්ම, යාග-හෝම පැවැත්වීම, බලිකර්ම, මංගලකර්ම, ප්‍රශස්ත ආදි අභිචාර විධීන් හා විවිධ පූජාවන් හරහා පාප විශෝධනය ආදිය චිකිත්සාවන් වේ.

අෂ්ටාංග ආයුර්වේදයට ඇතුළත් වන ශල්‍ය, ශාලක්‍ය, කාය චිකිත්සා, භූතවිද්‍යා, කෞමාර භෘත්‍ය, අගද තන්ත්‍ර, රසායන තන්ත්‍ර හා වාජීකරණ යන චිකිත්සා විධි අතුරින් රසායන, වාජීකරණ හා භූතවිද්‍යා විධි උන්මාද රෝග චිකිත්සාවන් සඳහා භාවිත වේ.[40] මෙයිනුදු විශේෂයෙන් ම භූතවිද්‍යා ක්‍රමය මෙම උන්මාද රෝගීන් විෂයෙහි මානසික ප්‍රතිකාර ලෙස භාවිත කෙරෙන බව බොහෝ විද්වත්හු පෙන්වා දෙති.[41] ප්‍රේමචන්ද්‍ර මාගම්මන මහතා උපකල්පනය කරන පරිදි භූතවිද්‍යා ක්‍රමය ආයුර්වේද වෛද්‍යවරුන් අතර එතරම් ජනප්‍රිය නොවීමට හේතුවක් වන්නට ඇත්තේ එහි විෂය පථය වන

ශාන්තිකර්ම ආදිය සඳහා පාරම්පරිකව ශිල්ප ගත් යකැදුරන් ආදි වෙනම ආචාර්යවරුන්, ශිල්පීන් පිරිසක් බිහිවීමයි.[42]

නූතන සමාජය තුළ ද විවිධ මනෝවිද්‍යාත්මක රෝග යැයි උපකල්පනය කළ හැකි රෝග සහිත පුද්ගලයන් සඳහා ශාන්තිකර්ම, බලි තොවිල් ආදිය පැවැත්වීම දැකිය හැකි ය. නැටුම් ගැයුම් වැයුම් ආදි විවිධ සංස්කෘතිකාංග සමග සිදු කරන එවැනි ශාන්තිකර්ම අවසානයේ බොහෝ රෝගීන් සුව වන අවස්ථා ද සමාජය තුළින් අසන්නට දකින්නට ලැබේ. විශේෂයෙන් ම රිද්දියාගය නම් ශාන්තිකර්මය දරුඵල අහිමි හෝ දරුඵල පමා වන කාන්තාවන්ට දරුඵල කැන්දන ශාන්තිකර්මයක් ලෙස සමාජය තුළ ඉතා ප්‍රකට ය. මීට අමතරව කොහොඹා කංකාරිය, සිද්දියාගය, සූනියම් ශාන්තිය, මහසොහොන් සමයම, සන්නි යකුම, ගම්මඩු පුරාණය, පුනාමඩු පූජාව ආදිය බෙහෙවින් දැකිය හැකි ශාන්තිකර්ම හා පූජාවන් වන අතර ඒ පිළිබඳව සිදු කරන ලද පර්යේෂණ ද බොහෝ වේ.

මෙවැනි ශාන්තිකර්ම භූතවිද්‍යා ක්‍රමයෙහි අංග හෝ සංවර්ධනයන් ලෙස සැලකිය හැකි නමුත් මේවා සිදු කරනු ලබන්නේ සහ පවත්වාගෙන යනු ලබන්නේ ආයුර්වේද වෛද්‍යවරුන් නොව පාරම්පරික ශිල්ප උරුම කරගත් යකැදුරන් ආදි ශිල්ප කරුවන් විසිනි. එවැනි ශාන්තිකර්මයක් මගින් රෝගීන්ගේ මනෝභාවයන් සකස් කිරීම, මානසික පීඩාවන් ඉවත් කිරීම, ගායන වාදන නර්තන ඔස්සේ මානසික උත්තේජනයක් හා ප්‍රබෝධයක් ඇති කිරීම, ආත්ම විශ්වාසය තහවුරු කිරීම ආදි මානසික චිකිත්සාවන් සිදු වන හෙයින් එය බොහෝ උන්මාද රෝගීන් හට සාර්ථක මනෝවිද්‍යාත්මක ප්‍රතිකාරයක් ද වේ.

**සමාලෝචනය**

ආයුර්වේදය අනුව පුද්ගලයා තුළ සත්ව ගුණය පිරිහී රජස් හා තමස් ගුණයන් උත්සන්න වීමෙන් විවිධ මනෝවිද්‍යාත්මක ආබාධ ඇති වේ. එසේ ඇති වන මානසික රෝග තත්වයන් හැඳින්වීම සඳහා පොදුවේ 'උන්මාද' යන ව්‍යවහාරය භාවිතව ඇති බව පෙනේ. එකී උන්මාදයන් කායික හේතු මෙන්ම මානසික හා ආගන්තුක ලෙස අර්ථකතනය කෙරෙන දේවාදී අධිභෞතික බලපෑම් මත ද ඇති විය හැකි බව ආයුර්වේදීය මතය වේ. රෝග හේතු අනුව නිජ සහ

ආගන්තුජ ලෙස ද සාධ්‍ය අසාධ්‍ය බව අනුව ද උන්මාද රෝග ද්විධ ද්විධ වේ.

දෝෂජ ලෙස හැඳින්වෙන වාතෝන්මාද, පිත්තෝන්මාද, කඵජ උන්මාද හා සන්නිපාතික උන්මාද සඳහා ඍජුව ම කායික ඖෂධ ප්‍රතිකාර නිර්දේශ කෙරෙයි. එසේම උපදේශාත්මක සාකච්ඡා හා රෝගියා අස්වැසීම ආදි මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ද යෝග්‍ය බව නිර්දේශ කොට තිබීම ආයුර්වේද මනෝචිකිත්සාවෙහි සුවිශේෂී ලක්ෂණයක් ලෙස සැලකිය හැකි ය. ආගන්තුක උන්මාද වන භූතෝන්මාද හෝ දේවෝන්මාද ආදියට මූලික වන්නේ ප්‍රඥාපරාධ හෝ දේවාදීන්ගේ බලපෑම් හෙයින් කුසල භාව වර්ධනය කෙරෙන චර්යාවන්හි නිරත කරවීමත් ශාන්තිකර්ම, බලි තොවිල් ආදියත් උන්මාද චිකිත්සාවන් ලෙස ආයුර්වේදයෙහි නිර්දේශ කෙරෙයි. ඒ අනුව අෂ්ටාංග ආයුර්වේදයෙහි භූතවිද්‍යා අංගය ද මනෝචිකිත්සක පදනමක් සහිත බව පෙන්වා දිය හැකි ය.

චරක සංහිතාවෙහි උන්මාද චිකිත්සා අධ්‍යායය අවසානයෙහි දක්වන උපදේශය ද ඉතා වැදගත් වේ. එනම්, උන්මාද හෙවත් මානසික රෝගවලට ගොදුරු නොවෙමින් මානසික ස්වස්ථතාව ඇති කර ගැනීමේ ක්‍රමය ද ආයුර්වේදයෙහි උපදේශිත ය. එහි දැක්වෙන පරිදි මත්ස්‍ය මාංශ ආදී සත්ව ආහාර අනුභවයෙන් වැළකී සිටීමෙන්, මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටීමෙන්, හිතකර භෝජන ආහාරයට ගැනීමෙන්, දමනය කළ ඉන්ද්‍රියන්ගෙන් යුක්තව සිටීමෙන්, පවිත්‍රතාවෙන් යුක්ත වීමෙන් හා සත්ව ගුණය හෙවත් මානුෂීය ගුණයන්ගෙන් යුක්තව සිටීමෙන් මානසික ස්වස්ථතාව ඇති කර ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකියාව තිබේ. එවැනි පුද්ගලයා තුළ ඉන්ද්‍රියාර්ථ, බුද්ධි, ආත්ම, මානස, ස්මෘති, සංඥාදිය පැහැදිලිව හා ස්වාභාවික අයුරින් ම ක්‍රියාත්මක වේ.

**ආන්තික සටහන්**


1. පෙරේරා, ඥානදාස සහ ෆොන්සේකා, නුවන්, *ප්‍රතිකාර මනෝවිද්‍යාව 1*, සහශ්‍ර, කොළඹ, 2004, පි. 1.

2. මාගම්මන, ප්‍රේමචන්ද්‍ර, *දේශීය ශාන්තිකර්ම මගින් පිළිබිඹු වන මනෝචිකිත්සාවේ*

*ප්‍රාථමික ලක්ෂණ*, ආයුර්වේද සමීක්ෂා, දෙවන වෙළුම, පළමු කළඹ, 2005, පි. 97.

3. ගල්මංගොඩ, සුමනපාල, *ආයුර්වේද අධ්‍යයන*, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය, යක්කල, 2003, පි. 21.
4. *චරක සංහිතාව*, ආර්. බුද්ධදාස (පරි.), රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1960, පි. 05.
5. ගල්මංගොඩ, සුමනපාල, එම, පි. 28.
6. *චරක සංහිතාව*, එම, පි. 07.
7. බන්දුසේන, ආර්.පී.ආර්.එස්., *සත්ව රජස් තමස් සහ ආයුර්වේදයේ මානසික රෝග*, 2016, උපුටා ගැනීම: http://swasthaarana.com/සත්ත්ව-රජස්-තමස්-සහ-ආයුර්/දිනය: 2021.03.04.
8. *චරක සංහිතාව*, එම, පි. 07.
9. සමරකෝන්, ඩී., *අෂ්ඨාංග ආයුර්වේදයේ එන භූත විද්‍යාව දේශීය කලාවට ඉටුකරන ලද මෙහෙය*, ආයුර්වේද සමීක්ෂා, දෙවන වෙළුම, පළමු කළඹ, 2005, පි. 221.
10. තෙන්නකෝන්, ඩී. එච්. සහ කරුණාරත්න, වයි.ඒ.යූ.ඩී., *උන්මාද රෝගය සඳහා ආයුර්වේද චිකිත්සාවේ සාඵල්‍යතාව*, ආයුර්වේද සමීක්ෂාව, දෙවන වෙළුම, සිව්වන කළඹ, ආයුර්වේද දෙපාර්තමේන්තුව, 2008, පි. 72.
11. *අංගුත්තරනිකාය 2*, රොගසුත්ත, බු.ජ.ත්‍රි.ග්‍ර. පි. 276.
12. *මජ්ඣිමනිකායට්ඨකථා 1*, මූලපණ්ණාසක, මූලපරියායසුත්තවණ්ණනා, ඡට්ඨ සංගායනා තිපිටක 4.0.
13. *සංයුත්තනිකායට්ඨකථා*, නිදාන වග්ග, පච්චයසුත්තවණ්ණනා, ඡට්ඨ සංගායනා තිපිටක 4.0.
14. *ජාතකට්ඨකථා 4*, දසක නිපාතො, සතපණ්ඩිතජාතක වණ්ණනා, ඡට්ඨ සංගායනා තිපිටක 4.0.
15. *පාරාජික ඛණ්ඩ අට්ඨකථා*, පඨමොභාගො, ආපත්තානාපත්තිවාරවණ්ණනා, ඡට්ඨ සංගායනා තිපිටක 4.0.
16. *සමන්තපාසාදිකා විනයට්ඨකථා 1* (සිංහල පරි.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 259.

17. *සමන්තපාසාදිකා විනයට්ඨකථා 1* (සිංහල පරි.), එම.

18. *ඛුද්දකපාඨට්ඨකථා* (සිංහල පරි.), ද්වත්තිංසාකාරවණ්ණනා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 49.

19. *ජාතකට්ඨකථා 3* (සිංහල පරි.), දරීමුඛ ජාතකය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 298-299.

20. *චරක සංහිතාව*, එම, පි. 241.

21. *චරක සංහිතාව*, එම, පි. 241.

22. *චරක සංහිතාව*, එම, පි. 241.

23. *චරක සංහිතාව,* එම, පි. 545.

24. *චරක සංහිතාව*, එම, පි. 546.

25. *චරක සංහිතාව*, එම, පි. 546.

26. *චරක සංහිතාව*, එම, පි. 242.

27. *චරක සංහිතාව*, එම, පි. 243.

28. ගල්මංගොඩ, සුමනපාල, එම, පි. 59.

29. *චරක සංහිතාව*, එම, පි. 243.

30. *චරක සංහිතාව*, එම, පි. 546.

31. *චරක සංහිතාව*, එම, පි. 547.

32. ගල්මංගොඩ, සුමනපාල, එම, පි. 61-62.

33. *චරක සංහිතාව*, එම, පි. 547.

34. තෙන්නකෝන්, ඩී. එච්. සහ කරුණාරත්න, වයි.ඒ.යූ.ඩී., එම, පි. 73.

35. එම, පි. 74.

36. ගල්මංගොඩ, සුමනපාල, එම, පි. 65.

37. තෙන්නකෝන්, ඩී. එච්. සහ කරුණාරත්න, වයි.ඒ.යූ.ඩී., එම, පි. 74.

38. *චරක සංහිතාව*, එම, පි. 549.

39. *චරක සංහිතාව*, එම, පි. 549.

40. තෙන්නකෝන්, ඩී. එච්. සහ කරුණාරත්න, වයි.ඒ.යූ.ඩී., එම, පි. 75.

41. i. මාගම්මන, ප්‍රේමචන්ද්‍ර, එම, පි. පි. 98.

    ii. ගල්මංගොඩ, සුමනපාල, එම, පි. 56.

    iii. තෙන්නකෝන්, ඩී. එච්. සහ කරුණාරත්න, වයි.ඒ.යූ.ඩී., එම, පි. 75.

42. මාගම්මන, ප්‍රේමචන්ද්‍ර, එම, පි. 99.